# 09

# ථෙර ගාථා අට්ඨක නිපාතය පිළිබඳ විමසුමක්

අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ,
ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශයේ සහකාර කථිකාචාර්ය

**පූජ්‍ය පහලගම ධම්මික ස්ථවිර**

---

සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නිකායේ ග්‍රන්ථ පහළොවෙන් වැඩි කොටසක් පද්‍යයෙන් සිදු කරන ලද දේශනාවෝ ය. ඒ අතර, ධම්මපදපාළි, සුත්තනිපාත, ජාතක, ථෙරගාථා, ථෙරීගාථා, අපදාන බුද්ධවංස ප්‍රමුඛත්වයක් ගන්නා කෘති වෙයි. ථෙර ගාථා පාළිය පිළිබඳ ව පරමත්ථදීපනී නම් ථෙරගාථාට්ඨකථාව නිර්වචන කරන්නේ මෙසේ ය. **''සුභූති ආදී තෙරවරුන් විසින් දේශනා කරන ලද ගාථාවෝ ය. ඇතැම් ගාථා තමන් වහන්සේලා විසින් මග ඵල සුවය නුවණින් විමසා බලා ප්‍රීති වාක්‍ය වශයෙන් දේශිත ය. ඇතැම් ගාථා සමවත් සුව විහරණ වශයෙන් විමසුම් නුවණින් දේශිත ය. තවත් ගාථා රැසක් පිරිනිවන්පාන සමයෙහි සසුනෙහි ඇති නිදහස්ශීලී බව ප්‍රකට ව දැක්වීම් වශයෙන් දේශනා කර ඇත. ඒ සියලු තෙරවරුන්ගේ ගාථාවෝ ය. ධර්ම සංගායනා කරන විට රැස්කර ථෙරගාථා යන නාමයෙන් ධර්ම සංග්‍රාහක භික්ෂූන් වහන්සේ විසින් සංග්‍රහ කරන ලදහ''**[1] යනුවෙන් ථෙරගාථා පාළිය පිළිබඳ මූලික වශයෙන් හඳුන්වා දී තිබේ.

මෙකී කෘතින් අතර ස්වභාව සෞන්දර්යය පිළිබඳ ව සිත්ගන්නා දේශනා අන්තර්ගත වන්නේ ථෙර ථෙරීගාථා පාළියෙන් ය. ථෙරී ගාථා හා ථෙර ගාථා යනු කාව්‍ය රසයන්ගෙන් අනූන ස්වභාව සෞන්දර්යයාත්මක සංකල්පනාවන්ගෙන් සමන්විත නිරාමිස විමුක්ති රසයෙන් පිරිපුන් පද්‍ය ග්‍රන්ථ දෙකකි. පෙරපර දෙදිග ම විචාරකයන්ගේ සම්භාවනාවට පාත්‍ර වූ ථෙර ථෙරී ගාථා බෞද්ධ සාහිත්‍යයේ පමණක් නො ව, විශ්ව සාහිත්‍යයෙහි ද සම්මානයට පාත්‍ර වූ ග්‍රන්ථ දෙකක් ලෙස හඳුන්වා දිය හැකි ය. අතිශය

කටුක අත්දැකීම් සමූහයකින් සමන්විත වූ ගිහි ජීවිතයත්, නිරාමිස ප්‍රීතියෙන් ලොව්තුරු සුව ගෙන දෙන පැවිදි ජීවිතයත් වෙන් කොට හඳුන්වා දෙන පූර්ණ බ්‍රහ්ම චර්යාව, අව්‍යාජ දිවි පැවැත්ම, අල්පේච්ඡතාව, සරල බව, සැහැල්ලු බව ආදී උදාර, ගුණයන්ගෙන් සමන්විත බුද්ධකාලීන භික්ෂු භික්ෂුණීන්ගේ උත්තරීතර හැඟුම් සමුදායක් මෙම ථෙර ථෙරී ගාථා තුළ අන්තර්ගත වෙයි. ඒවා භාවාත්මක ප්‍රකාශන වශයෙන් දේශනා පාළියට අයත් වී තිබේ. එහි ස්වභාව සෞන්දර්යය මෙන් ම රහත් බවෙහි සැප සහිත බව සියුම් සේ විවරණය වී ඇත.

**සමාජයේ විවිධ සමාජ ස්ථරයන් තුළ විවිධාකාරයෙන් දිවි ගෙවූ පිරිස් පැවිදි ව තමා ලත් විමුක්ති සුඛය ථෙර ගාථා තුළ අන්තර්ගත වෙයි.** අනේකවිධ වූ දුක් කම්කටොලු වලින් පිරි ගිහි ජීවිතයෙන් මිදුණු පසු සිතට දැනෙන්නා වූ විමුක්ති සුවය වචනවලින් ප්‍රකාශ කිරීම දුෂ්කර ය. එහෙත් හද පත්ලෙන් ම නැග ආවා වූ ගැඹුරු අර්ථයෙන් සමන්විත වූ ඒ සදාතනික වූ ධර්මතාව කවියකට නැඟීමට තරම් බුද්ධ කාලීන භික්ෂු භික්ෂුණීහු සමත් වූහ. කවි සමයෙහි දක්නට ලැබෙන සියලු සාධු සම්මත රීතීන්ගෙන් යුක්ත වූ ථෙර ථෙරී ගාථා කිසිවිටකත් අතිශයෝක්තියෙන් යුක්ත නො වී ය. ප්‍රකෘති භාවයෙන් යුක්ත වූ මෙම කාව්‍යයන්හි සෑම විට ම අවශ්‍ය තැන්වල දී උපමා රූපක නියමාකාරයෙන් යොදාගෙන ඇත. මිනිස් චිත්ත සන්තානය තුළ පැන නගින්නා වූ උතුම් මිනිස් ගුණ වන කරුණාව, මුදිතාව, උපේක්ෂාව, මෛත්‍රිය වැනි ගුණයන් ද, අලෝභ, අද්වේෂ, අමෝහ වැනි වීතරාගී හැඟීම් පිළිබඳ ව ද, ජීවිතයේ අනිත්‍ය ස්වභාවය පිළිබඳ ව ද අපූරු අන්දමින් වර්ණනා කොට ඇති ආකාරය ථෙර ථෙරී ගාථා මඟින් ප්‍රකට වේ. එනිසා ම ලෝක සත්ත්වයා පිළිබඳ ව උත්තරීතර දර්ශනයක් ද, පරිපූර්ණ වූ කාව්‍යමය දෘෂ්ටියක් ද මෙම කාව්‍ය තුළ ගැබ් ව ඇත. බුද්ධ කාලීන මහ තෙරවරුන් හා තෙරණියන්ගේ අරමුණ වූයේ කවියන් වීම නොව, සසරෙහි පවත්නා අනිත්‍ය දුක්ඛ අනාත්ම ස්වභාවය වටහාගෙන ඒ ඔස්සේ ජීවිතයේ ඇති සියලු බැඳීම් වලින් නිදහස් ව උතුම් වූ නිර්වාණය අවබෝධයට පත්වීම යි. ඒ නිසා ම උන්වහන්සේලා ඒ සඳහා සුදුසු ස්ථාන කරා වැඩියහ. සියලු ලෞකික බැඳීම්වලින් මිදී එකලා ව පිහිටි වන සෙනසුන් කරා වැඩි මහ තෙරවරු හා තෙරණියෝ කෙලෙස් බැම්මෙන් මිදෙන්නට භාවනා මාර්ගයේ යෙදෙන්නට වූහ. අවසානයේ උන්වහන්සේලාට තමන් අපේක්ෂා කළ විමුක්ති මාර්ගය හමු විය. ඝෝර සංසාරය බැඳ තැබූ තෘෂ්ණාව නැමැති කෙලෙස් හුය කඩා බිඳ දැමීම ප්‍රීතිය අධික වීමට කරුණකි. එසේ තමන්වහන්සේ ලබාගත් විමුක්ති සුඛ වාග්

මාලා වශයෙන් ගීතවත් විය. ඒවා හුදු ගී නො වේ. මනෝ භාවයන් ය. විරාගිකත්වය මත පදනම් වූ චිත්ත සංකල්පනයෝ ය. එයින් තමාගේ ගිහි කල ජීවිත මාර්ගය, විවිධ අත්දැකීම් කළ කී දෑ ආදිය විටෙක ප්‍රකාශ විය. තවත් විටෙක ස්වභාව සෞන්දර්යයේ පවත්නා චමත්කාරය ප්‍රකාශ විය. ථේරගාථා පාළියේ එබඳු තෙරවරුන් අතර සප්පක, ගිරිමානන්ද, තාලපුට, වංගීස වැනි මහ තෙරවරුන් හා එකී තෙරවරුන්ගේ ගී තුළ කාව්‍යාත්මක ලක්ෂණ හා භාවාත්මක ප්‍රකාශන දක්නට ලැබේ.

ථේරගාථා පාළිය ප්‍රථම සංගායනාවේ දී බෙදා වෙන්කොට තිබෙන්නේ නිපාත යන වර්ගීකරණ ක්‍රමය ඔස්සේ ය. 'නිපාත' යන්න සඳහා ප්‍රධාන අර්ථයන් ව්‍යාකරණය තුළ දක්නට ලැබේ. ඒ අව්‍ය ගණයෙහි ගැනෙන පද විශේෂයකි. මෙහි දී එම අර්ථය නො ගනී. කොටස්වලට බෙදූ, නිපාතකළ, පරිච්ඡේදකළ යන අර්ථයෙන් ථේරගාථාපාළියේ නිපාත යන්න භාවිත කොට තිබේ. "නිපාතනං නික්ඛිපනන්ති නිපාතො. එකො එකෙකො ගාථානං නිපාතො නික්ඛෙපො එත්ථාති එකනිපාතො."[2] ග්‍රන්ථය තුළ දක්නට ඇති පරිච්ඡේදකරණය නිපාත නම් වෙයි. එය විධිමත් ග්‍රන්ථාන්තර්ගතය බෙදා දැක්වීමක් වෙයි. තෙරවරුන් 263 දෙනෙකුගේ දේශනා ථේරගාථා නිපාත 21 පුරා සංග්‍රහ කොට තිබේ. ඒකක නිපාතයේ තුළ වග්ග 12කි. සෑම වග්ගයක ම තෙරවරු 10 දෙනෙක් වෙති. ඒ අනුව ඒකක නිපාතයේ තෙරවරුන් 120කි.[3] දුක නිපාතයේ වග්ග පහකි. පස්වෙනි වග්ගයේ තෙරවරුන් 9කි. අනෙක් වග්ගවල තෙරවරුන් 10 බැගිනි. ඒ අනුව දුක නිපාතයේ තෙරවරු 49කි. තික නිපාතයේ තෙරවරු 10කි. චතුක්ක නිපාතයේ තෙරවරු 12කි. පඤ්චක නිපාතයේ තෙරවරු 12කි. ඡක්ක නිපාතයේ තෙරවරු 14කි. සත්තක නිපාතයේ තෙරවරු 05කි. අට්ඨක නිපාතයේ තෙරවරු 03කි. නවක නිපාතයේ තෙරවරු 01කි. දසක නිපාතයේ තෙරවරු 07කි. ඒකාදස නිපාතයේ තෙරවරු 01කි. ද්වාදස නිපාතයේ තෙරවරු 02කි. තෙරස නිපාතයේ තෙරවරු 01කි. චුද්දක නිපාතයේ තෙරවරු 02කි. සොළස නිපාතයේ තෙරවරු 02කි. වීසති නිපාතයේ තෙරවරු 10කි. තිංසති නිපාතයේ තෙරවරු 03කි. චත්තළීස නිපාතයේ 01කි. පඤ්ඤාස නිපාතයේ තෙරවරු 01කි. සට්ඨි නිපාතයේ තෙරවරු 01කි. සත්තති නිපාතයේ තෙරවරු 01කි. ථේරගාථා පාළිය නිපාත ක්‍රමය ඔස්සේ වර්ගීකරණය කොට ඒ ඒ තෙරවරුන්ගේ ගාථා සංග්‍රහ කොට තිබෙයි. තෙරවරුන් දේශිත ගාථා සංඛ්‍යාව අනුව නිපාත වර්ග කොට ඇත.

ථේරගාථා පාළිය සඳහා අට්ඨකථාව සම්පාදනය වන්නේ ක්‍රි. ව. 06 වන සියවසේ දී පමණ ය. බදිරතිත්ථවාසී ධම්මපාල ආචාරීන් විසින්

පරමත්ථදීපනී නාම ථේරගාථාට්ඨකථා නමින් අට්ඨකථාව සම්පාදනය කොට තිබේ. ''කා පනෙතා ථෙරගාථා ථෙරීගාථා ච, කථඤ්ච පවත්තාති, කාමඤ්චායමත්ථො ගාථාසු වුත්තොයෙව පාකටකරණත්ථං පන පුනපි වුච්චතෙ තත්ථ ථෙරගාථා තාව සුභූතිත්ථෙරාදීහි භාසිතා. යා හි තෙ අත්තනා යථාධිගතං මග්ගඵලසුඛං පච්චවෙක්ඛිත්වා කාචි උදානවසෙන, කාචි අත්තනො සමාපත්තිවිහාරපච්චවෙක්ඛණවසෙන, කාචි පුච්ඡාවසෙන, කාචි පරිනිබ්බානසමයෙ සාසනස්ස නියාානිකභාවවිභාවනවසෙන අභාසිංසු, තා සබ්බා සඞ්ගීතිකාලෙ එකජ්ඣං කත්වා ථෙරගාථා ඉච්චෙව ධම්මසඞ්ගාහකෙහි සඞ්ගීතා. ථෙරීගාථා පන ථෙරියො උද්දිස්ස දෙසිතා.''[4] අට්ඨකථා විවරණය හා පෙළ ථේරගාථා පෙළ අතර සුළු වෙනස්කමක් දක්නට ලැබේ. බුද්ධ ජයන්ති මුද්‍රණයේ දැක්වෙන චතුක්ක නිපාතයේ ඇත්තේ තෙරවරුන් 12කි. ථේරගාථාට්ඨකථාවේ තෙරවරුන් 13ක් වශයෙන් දක්වයි.[5] ථේරගාථා පාළි බුද්ධ ජයන්ති මුද්‍රණයේ 103 පිටුවේ දැක්වෙන උද්දාන ගාථාවේ[6] මේ බව පාදක සටහනක් තුළින් පෙන්වා තිබේ. ඉන්පසු වීසති නිපාතයෙහි ගාථා සංඛ්‍යාව ථේරගාථා අට්ඨකථාවේ දැක්වෙන්නේ තෙරවරුන් දහයක් බවත් එහි ගාථා 245කට අධික බවත් ය.[7] නමුත් ගාථා ඇත්තේ 235කි. මෙසේ සංඛ්‍යාත්මක වශයෙන් වෙනස් වූ විට ථේරගාථා පාළියේ සම්පූර්ණ ගාථා ගණන 284 බවට පත් වෙයි. නමුත් අට්ඨකථාව දක්වන්නේ 1,360 වශයෙනි.[8] පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ ථේරගාථාපාළියේ ගාථා ගණන 1,279 වශයෙන් දක්වති.[9]

ථේරගාථා පාළියේ ගාථා අටකට නො අඩු සංඛ්‍යාවක් ගාථා ඇති තෙරවරුන්ගේ ගාථා අට්ඨක නිපාතය නමින් නම් කර තිබෙයි. අට්ඨක නිපාතයේ තෙරවරුන් තිදෙනෙකු හා ගාථා 24 අන්තර්ගත වෙයි. මෙම නිපාතය අට්ඨක නිපාතය වශයෙන් නම් කොට ඇත්තේ දේශනා කළ ගාථා සංඛ්‍යාව අටක් හෙයිනි. මෙම නිපාතයෙහි අන්තර්ගත ථේරගාථා වන්නේ

- මහාකච්චායනථේරගාථා
- සිරිමිත්තථේරගාථා
- මහාපන්ථකථේරගාථා

අට්ඨක නිපාතය තුළ අන්තර්ගත වන්නේ මෙම තෙරවරුන්ගේ ගාථාවන් ය. මහාකච්චායන තෙරුන් සිරිමිත්ත තෙරුන් හා මහාපන්ථක තෙරුන් ත්‍රිපිටක සාහිත්‍යයෙහි ප්‍රසිද්ධ චරිත සහිත උතුමන් ය. ආදර්ශවත් චරිත වශයෙන් සාහිත්‍යයට එක් වී තිබේ.

මහාකච්චායන ථෙර

පදුමුත්තර බුදුරදුන්ගේ දවස මහාසාර කුලයක ඉපදී තිබේ. තුරුණු වියට පත් කුමරු දිනක බුදුරදුන් හමුවෙහි ධර්ම ශ්‍රවණය කරමින් සිටියේ ය. එහි දී සංක්ෂිප්ත ව දේශනා කළ ධර්ම විස්තර වශයෙන් දේශනා කිරීමේ අග්‍රස්ථානය ලබාදීම දැක, ඒ පිළිබඳ ප්‍රාර්ථනාවෙන් දෙව් මිනිස් දෙගතියේ සැරිසරා සුමේධ බුදුරදුන්ගේ කාලයේ විද්‍යාධරයෙක් ව ඉපදී, සුමේධ බුදුරදුන්ට කිණිහිරි මල් පුදා එහි විපාක වශයෙන් දෙව් මිනිස් සැප විඳ තිබේ. කාශ්‍යප බුදුරදුන්ගේ කාලයේ ඉපිද බුදුරදුන් පිරිනිවි ස්ථානයේ රන්සෑය වෙත රන් ගඩොල් පූජා කොට මතු උත්පත්තිවල ශරීරය රන් පාට වේවායි ප්‍රාර්ථනා කොට තිබේ. මෙසේ සසර සැරිසරා, ගෞතම බුදුරදුන් ලොව පහළ වූ කාලයේ උදේනි පුරයේ චණ්ඩපජ්ජෝති රජුගේ පුරෝහිත බමුණාගේ පුත්‍ර ව ඉපදී තිබේ. මෙම කුමාරයාට නම තබන දවස සිය මෑණියන් පුතුට **කඤ්චමානවක** යනුවෙන් නම් තබා තිබේ. ත්‍රිවේදය පිළිබඳ දැනුම ලැබූ මේ කුමරු සිය පියාගෙන් පසු පුරෝහිත තනතුරු දැරී ය. ඔහු කච්චායන යන ගෝත්‍ර නාමයෙන් හඳුන්වන්නට විය. බුදුරදුන් සමීපයේ ධර්මය අසා රහත් බවට පත්විය. බුදුරදුන් සමීපයෙහි ඒහි භික්ඛු මහණ උපසම්පදාවට පත් වී චණ්ඩපජ්ජෝත රජුට දහම් දෙසා රජු ධර්මයෙහි පිහිටවූහ.

කච්චායන මහ රහතන් වහන්සේගේ පැවිද්ද හා බැඳී කථා පුවත් අපදානපාළියෙහි ද අන්තර්ගත වෙයි. කච්චායන මහ රහතන් වහන්සේට සංක්ෂිප්ත වශයෙන් දේශනා කළ දෑ විස්තරාර්ථ වශයෙන් දේශනා කිරීමේ හැකියාව පැවතිණි. එම නිසා බුදුරදුන් **''එතදග්ගං, භික්ඛවෙ, මම සාවකානං භික්ඛූනං සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං විභජන්තානං යදිදං මහාකච්චානොති''**[10] කච්චායන ථෙරුන් විසින් ගාථා අටක් දේශනා කොට තිබේ. එකී ගාථා දේශනා කිරීමේ හේතුව වූයේ බොහෝ භික්ෂූන් වහන්සේ බොහෝ කර්මාන්ත ආදිය පිළිබඳ කථා සල්ලාපයෙහි යෙදී සිටි අවස්ථාවක ඒ භික්ෂූන්ට උපදෙස් දීම් වශයෙනි.

**කම්මං බහුකං න කාරයෙ - පරිවජ්ජෙය්‍ය ජනං න උය්‍යමෙ,**
**සො උස්සුක්කො රසානුගිද්ධො - අත්ථං රිඤ්චති යො සුඛාධිවාහො.**

බොහෝ කර්මාන්තවල යෙදීම, සමූහ සාකච්ඡාවල නිරතවීම, සිවුපසයට ගිජුවීම අත්හැරිය යුතු බව ප්‍රකාශ කරයි. එයින් සිදුවන්නේ සුවදායක කිසියම් අර්ථයක් වූයේ නම් එය නො ලැබීයාම යි. බොහෝ කර්මාන්තවල භික්ෂුව නියැලීම මහණදම් පුරන්නට බාධාවකි. භික්ෂුවට

ඇත්තේ අල්ප කෘත්‍යයන් ය. බහු කෘත්‍ය භික්ෂු දිවිය තුළ නැත. කිසියම් ආකාරයක බහු කෘත්‍ය වන්නේ නම් මහණදම් පුරන්නට දුෂ්කර වෙයි. අල්ප කෘත්‍ය යන්න වැරදි ලෙස අර්ථගන්වා නැත. එනම් සියල්ල නො කර සිටීම නො වෙයි. **කිසියම් ප්‍රමාණයක කුඩා ප්‍රමාණ වූ කැඩුණු බිඳුණු ස්ථාන පිළිසකර කරගැනීම කළ යුත්තේ ම ය**[11]. මෙහි දී අදහස් කරන්නේ කර්මාන්ත ව්‍යාපාරාදිය සිදුකිරීම මහණදම් පුරන්නට බාධා වන බව යි. සමූහ වශයෙන් සාකච්ඡා කිරීමෙන් කුසල් දහම් යටපත් වී අකුසල් වර්ධනය වෙයි. ඒ නිසා පවිටු දනන් දුරුකළ යුතු ය. **කුසලයන්හි ඇලීම මඩ ගොඩෙහි වැටීමක් සේ දැක්වෙයි. පාපී අදහස් ඇත්තේ ආමිසයෙහි ඇලෙයි. එය ම ප්‍රණීතකර සේ දකියි.** කච්චායන තෙරුන්ගේ අවවාදය ආරම්භ වන්නේ මහණදම් පිරීම සඳහා භික්ෂූන් ආධ්‍යාත්මික හා බාහිර වශයෙන් සකස් විය යුතු ආකාරය පිළිබඳ උපදෙස් සපයමිනි. කච්චායන ථෙරගාථාවේ තුන්වැනි ගාථාවේ සිට අටවැනි ගාථාව දක්වා ඇති ගාථා හය චණ්ඩපජ්ජෝත රජුට අවවාද වශයෙන් දේශනා කොට තිබේ.[12] චණ්ඩපජ්ජෝත රජු විසින් බ්‍රාහ්මණ ධර්මයන් පිළිගෙන සිදුකරන සත්ත්ව ඝාතනය, යාග හෝම, නො විමසා සොරකම් නො කළ අය සොරු යන විනිශ්චයෙන් දඬුවම් සිදු කිරීම, ධනයට නිසි හිමිකරුවන්ට එකී ධනය හිමි නො කොට හිමිකාරිත්වය නොමැති අයට ධනය හිමි කිරීම, මෙබඳු නුසුදුසු ක්‍රියාවන් රාශියක් විවේචනය කරමින් කච්චායන තෙරුන් සිය භාව ප්‍රකාශන ඉදිරිපත් කළ බව අට්ඨකථාවේ දැක්වේ.

**සිරිමිත්ත ථෙර**

පෙර බුදුවරුන්ගේ කල භවයන්හි උපත ලබා, තිවන් ප්‍රාර්ථනා කොට පැමිණ ගෞතම බුදුරදුන් දවස රජගහ නුවර මහ ධනවත් කෙළෙඹියෙකුට දාව උපන්නේ ය. මෙම කුමරු සිරිමිත්ත නමින් ප්‍රකට විය. මෙම කුමාරයාගේ මව සිරිගුප්ත උපාසකයාගේ නැගෙණිය වූවාය. බුදුරදුන් නාලාගිරි ඇතා දමනය කළ අවස්ථාවේ දී එයින් පැහැදී සිරිමිත්ත කුමරු ශ්‍රද්ධාව ඇති වී සසුනේ පැවිදි විය. සිරිමිත්ත තෙරුන්වහන්සේ විදර්ශනා වඩා රහත් බවට පත් වූහ. ප්‍රාතිමෝක්ෂ දේශනා කරන අවස්ථාවක විසිතුරු විජින පතක් ගෙන ආසනාරූඪ වී සිරිමිත්ත තෙරුන් වහන්සේ දහම් දෙසූහ.

සිරිමිත්ත ථෙරගාථාවේ පැවිද්දාගේ උසස් ගුණයන් පිළිබඳ පළමු ගාථා හතෙන් ප්‍රකාශ වෙයි. අවසාන ගාථාවෙන් ප්‍රකාශවන්නේ ශ්‍රද්ධා සීල ආදී ගුණයන් ඇති කර ගැනීමත් බුදුරදුන්ගේ අනුශාසනා සිහිකර ගැනීමත් ධර්ම මාර්ගයේ ගමන් කිරීමත් පිළිබඳ උපදේශයන්ය. පළමු

ගාථාවේ සිට හතරවන ගාථාව දක්වාම සමාන අදහසක් ප්‍රකාශ වෙයි. නොකිපීම, වෛර නොකිරීම, මයා රහිතවීම, පිසුණු බස් නොකියන පැවිද්දා පරලොව ශෝක නොකරන බව දක්වයි. ථෙරගාථාට්ඨකථාවේ දී 'අක්කොධනො' යන්න පැහැදිලි කරන්නේ මෙසේය. නොකිපෙන ස්වභාව ඇති, කෝපයට පත්වන අරමුණක් ඇති කල්හි ඉවසීම, ක්‍රෝධ සිත නූපදවා සිටීම, ක්‍රෝධ නොකිරීම යථාර්ථයෙහි ගැබ් වී ඇත.[13] යහපත් වූ සුන්දර වූ සිල් ඇති භික්ෂුව 'කල්‍යාණසීලො' නම් වෙයි.[14] 'කල්‍යාණමිත්තො' පිය වූ ගරු කටයුතු බව ඇතිවන්නා වූ වතාවත්හි යෙදෙන, ඉවසීම ඇති, ගැඹුරු කථා ඇතිව යහපත් දේහි යොදවන මිතුරන් ඇත්තා කල්‍යාණමිත්ත නම් වෙයි.[15] සන්දර වූ ප්‍රඥාවෙන් යුක්ත වූ නිවන කෙරෙහි මෙහෙය වන ප්‍රඥාව 'කල්‍යාණපඤ්ඤො' නම් වෙයි.[16] ක්‍රෝධ නොකරන්නා වූ භික්ෂුවගේ සිතේ ස්වභාවය විශේෂණ කීපයකින් ම දක්වා තිබේ. යම් අයෙකුගේ ශ්‍රද්ධාව බුදුරදුන් කෙරෙහි නොසෙල් වී පිහිටියේ ද කල්‍යාණ වූ සීල ඇත්තේ ද ඔහුගේ ගුණයෝ ආර්ය උතුමන් විසින් පසස්නේය. සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රසාදය ඇත්තේ ද ඍජු දැකීම ඇත්තේ ද එබඳු පුද්ගලයා දිළින්දෙක් නොවෙයි. මෙහි දී 'දාළිද්දොති තං අහු' යන්න පිළිබඳ අට්ඨකථා නිර්වචනය වන්නේ මෙසේය. ශ්‍රද්ධා ධනය, සීල ධනය, සුත ධනය, චාග ධනය, පඤ්ඤා ධනය යන පිරිසිදු ධනයන්ගෙන් යුක්ත බැවින් දිළිඳු නොවේයැයි කියයි.[17] මෙහි දී ආධ්‍යාත්මක ගුණ සමුදායන් රාශියක් කියවේ. මෙම ථෙරගාථාවේ අවසන් ගාථා තුන තෙරුවන් සිහිපත් කරන ස්වභාවයෙන් ප්‍රකාශ කොට තිබේ.

**මහාපන්ථක තෙර**

පෙර පදුමුත්තර බුදුරදුන්ගේ කාලයේ මහධනවත් හංසවතී නුවර කෙළෙඹියෙව උපත ලැබීය. දිනක් පදුමුත්තර බුදුරදුන්ගෙන් ධර්ම ශ්‍රවණය කරමින් සිටි ඔහු බුදුරදුන් විසින් අග්‍රස්ථානයෙහි තබන භික්ෂුවක් දුටුවේය. එකී අග්‍රස්ථානය අරූප ධ්‍යානයෙන් නැගිට රහත් බව ලබන්නන්ගෙන් අග්‍රස්ථානයයි. එය සසරේ ප්‍රාර්ථනා කරමින් දන් පින්කම් සිදුකරමින් දෙව් මිනිස් දෙගතියේ සැරිසැරුවේය. මෙකී ප්‍රාර්ථනාව කල්ප ලක්ෂයක් මත්තෙහි බුදුවන ගෞතම බුද්ධ සාසනයෙහි දී මේ ප්‍රාර්ථනාව ඉටු වන බවට විවරණ දුන්හ. ගෞතම බුදුරදුන් දෙව්රම්වෙහෙරෙහි දම්සක් දෙසුම සිදු කරන කාලයේ රජගහ නුවර සිටුතුමාගේ දියණියක් දාසයකු හා කුළුපග වී දාසයා සමග පළා ගියේය. දාසයට දාව රජගහ නුවර දියණියගේ කුස දරුවෙකු පිළිසිඳ ගත්තාය. මොවුන් දෙදෙනා ජීවත්වූයේ පිටිසර ගමකය. දරුවා බිහිකිරීම සඳහා ගෙදර බලා එමින් සිටිය දී මහ මග දරුවා බිහි

විය. ඒ දරුවාට පන්ථ යන නම් විය. මෙසේ දෙවැනි වරත් පෙර සේම දරුවා මහ මග බිහිවීම නිසා ඒ දරුවා 'චූල්ලපන්ථ' වූ අතර පළමු දරුවා 'මහාපන්ථක' නම් විය. මහාපන්ථකයෝ බුදුරදුන්ගෙන් ධර්ම ශ්‍රවණය කොට පැහැදී පැවිද්දට පත්විය.

මහාපන්ථක සාමණේරයන් වහන්සේ විසිවස් පූර්ණයත් සමග උපසම්පදාව ලැබුවේ ය. යෝනිසො මනසිකාරයෙන් ක්‍රියාත්මක වූ උන්වහන්සේ සතර අරූප ධ්‍යාන උපදවාගෙන ඉන් නැගිට විදර්ශනාවෙහි සිත පිහිටුවා රහත් බවට පත්වූහ. මහාපන්ථක තෙරුන් වහන්සේ අරූප ධ්‍යානයෙහි සමවැදීමට සමත් භික්ෂූන් අතර අග්‍රස්ථාන ලැබූහ[18]. මහාපන්ථක තෙරුන් අරූප ධ්‍යානයන්ට සමවැදී ඵල සුවයෙන් කල් ගෙවනුයේ දිනක් තම පිළිවෙත් මාර්ගය දෙස හැරී බලන්නේ ලබන සම්පත් නිසා සිංහනාද කරමින් මෙම ගාථා අට දේශනා කොට තිබේ.

මහාපන්ථක ථෙරගාථාවේ පළමු ගාථාවෙන් ප්‍රකාශ වන්නේ බුදුරදුන් පිළිබඳ ශ්‍රද්ධා මාත්‍ර හැඟීන්වීමකි. මහාපන්ථක තෙරුන් බුදුරදුන් හමු වූ ආකාරය දක්වා තිබේ. මහාපන්ථක තෙරුන්ගේ සීයා සමග බුදුරදුන් හමුවීම සඳහා දෙව්රමට ගිය බව අට්ඨකථාවේ දැක්වෙයි.[19] මහපන්ථක ථෙරගාථාව අවසන්වන්නේ උන්වහන්සේගේ රහත්ඵලය පිළිබඳ ප්‍රකාශ කිරීමෙනි.[20] මහතෙරවරුන් යම් යම් අවස්ථාවල දී ස්වකීය ඵලසමාපත්තිය පිළිබඳ සිදුකරන ප්‍රකාශවල ස්වභාවය මෙයින් දක්නට ලැබේ.

ථෙරගාථාපාළියේ අට්ඨක නිපාතය පිළිබඳ විමසීමේ දී එහි උපයුක්ත භාෂා ස්වභාව සෞන්දර්යාත්මක පැතිකඩ විද්‍යමාන වෙයි. භාව ප්‍රකාශන තුළින් අරහත්ඵල විමුක්තිය පිළිබඳ භාව ප්‍රකාශනය දක්නට ලැබේ. සසර කටුක බව හා නිවන තුළ ඇති සුඛය ආදිය එහි වර්ණනාවට ලක්ව් තිබේ.

**ආන්තික සටහන්**

1. ථෙරගාථා අට්ඨකථා, තත්ථ ථෙරගාථා තාව සුභූතිත්ථෙරාදීහි භාසිතා, යා හි තෙ අත්තනා යථාධිගතං මග්ගඵලසුඛං පච්චවෙක්ඛිත්වා කාචි උදානවසෙන, කාචි අත්තනො සමාපත්තිවිහාරපච්චවෙක්ඛණවසෙන, කාචි පුච්ඡාවසෙන, කාචි පරිනිබ්බානසමයෙ සාසනස්ස නිය්‍යානිකභාවවිභාවනවසෙන අභාසිංසු, තා සබ්බා සඞ්ගීතිකාලෙ එකජ්ඣං කත් වා රෙගාථා ඉච්චෙව ධම්මසඞ්ගාහකෙහි සඞ්ගීතා.
2. ථෙරගාථා අට්ඨකථා I කොටස, හේවාවිතරණ මුද්‍රණ, 1918.
3. ථෙරගාථා අට්ඨකථා I කොටස, හේවාවිතරණ මුද්‍රණ, 1918, 3 පිටුව, තත්ථ එකනිපාතෙ ද්වාදස වග්ගා, එකෙකස්මිං වග්ගෙ දස දස කත්වා විසුත්තරසතං

ථෙරා, තත්තිකා එව ගාථා, වුත්තඤ්හි විසුත්තරසතං ථෙරා, කතකිච්චා අනාසවා. එකකම්හි නිපාතම්හි, සුසඞ්ගීතා මහෙසිහීති.

4. ථෙරගාථා අට්ඨකථා I කොටස, හේවාවිතරණ මුද්‍රණ, 1918.
5. ථෙරගාථා අට්ඨකථා I කොටස, හේවාවිතරණ මුද්‍රණ, 1918, 3 පිටුව, චතුක්කනිපාතෙ තෙරස ථෙරා.
6. ථෙරගාථා පාළි, බුද්ධ ජයන්ති මුද්‍රණ, 2006, 222 පිටුව.
අධිමුත්තො පාරාසරියො තෙලකානි රට්ඨපාලො
මාලුංක්‍යසෙලො භද්දියො අංගුලි දිබ්බචක්ඛුකො
පාරාසරියො දසෙතෙ වීසතිනිපාතම්හි පරිකිත්තිතා
ගාථායො ද්වෙසතා හොන්ති පඤ්චතාලීස උත්තරින්ති.
7. එම, වීසතිනිපාතෙ දස ථෙරා, පඤ්චචත්තාලීසාධිකානි ද්වෙ ගාථාසතානි
8. එම, සහස්සං හොන්ති තා ගාථා, තීණි සට්ඨි සතානි ච,
ථෙරා ච ද්වෙ සතා සට්ඨී, චත්තාරො ච පකාසිතාති.
9. පාලි සාහිත්‍යය, බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, රතන පොත් ප්‍රකාශකයෝ, 2012, 98 පිටුව.
10. අංගුත්තර නිකාය I කොටස, එතදග්ගපාළි, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006, 46 පිටුව.
11. ථෙරගාථා, 485 පිටුව, හේවාවිතාරණ මුද්‍රණ, 1918, බුද්දකං අප්පසමාරම්භං බණ්ඩඵුල්ලපටිසඞ්ඛරණාදිං සත්ථු වචනපටිපූජනත්ථං කාතබ්බමෙව.
12. එම, 486 පිටුව. ඉමා ජ ගාථා රඤ්ඤො පජ්ජොතස්ස ඔවාදවසෙන අභාසි. සො කිර බ්‍රාහ්මණෙ සද්දහිත්වා පසුඝාතයඤ්ඤං කාරෙති, කම්මං අසොධෙත්වාව අචොරෙ චොරසඤ්ඤාය දණ්ඩෙසි, අට්ටකරණෙ ච අස්සාමිකෙ සාමිකෙ කරොති, සාමිකෙ ච අස්සාමිකෙ, තතො නං ථෙරො විවෙචෙතුං.
13. එම, 489 පිටුව, තත්ථ අක්කොධනොති අකුජ්ඣනසීලො, උපට්ඨිතෙ හි කොධුප්පත්තිනිමිත්තෙ අධිවාසනඛන්තියං ඨත්වා කොපස්ස අනුප්පාදකො.
14. එම, කල්‍යාණසීලොති සුන්දරසීලො සුවිසුද්ධසීලො.
15. එම, එවං විභාවිතලක්ඛණො කල්‍යාණමිත්තො එතස්සාති කල්‍යාණමිත්තො.
16. එම, කල්‍යාණපඤ්ඤොති සුන්දරපඤ්ඤො, යදිපි පඤ්ඤා නාම අසුන්දරා නත්ථි, නිය්‍යානිකාය පන පඤ්ඤාය වසෙන එවං වුත්තං.
17. එම, 490 පිටුව, අදලිද්දොති තං ආහු සද්ධාධනං, සීලධනං, සුතධනං, චාගධනං, පඤ්ඤාධනන්ති ඉමෙසං සුවිසුද්ධානං ධනානං අත්ථිතාය අදලිද්දොති තං තාදිසං පුග්ගලං බුද්ධාදයො අරියා ආහුධ.
18. අංගුත්තර නිකාය I කොටස, එතදග්ගපාළි, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006, 46 පිටුව, එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං සඤ්ඤාවිවට්ටකුසලානං යදිදං මහාපන්ථකො.
19. ථෙරගාථා, 492 පිටුව, හේවාවිතාරණ මුද්‍රණ, 1918, චතුවෙසාරජ්ජවිසාරදං දිට්ඨධම්මිකසම්පරායිකපරමත්ථෙහි වෙනෙය්‍යානං යථාරහමනුසාසනතො සත්ථාරං සම්මාසම්බුද්ධං මය්හං පිතාමහෙන සද්ධිං ගන්ත්වා යාය වෙලාය සබ්බපඨමං පස්සිං.
20. එම, 493 පිටුව, සබ්බං තණ්හන්ති කාමතණ්හාදිභෙදං සබ්බං තණ්හාසොතං අග්ගමග්ගෙන.